# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය.

**අභියාචනා අංක:- AAT/197/2020 (NPC)**

ආර්.එම්.ඩී.රාජපක්ෂ

**අභියාචක**

**එදිරිව,**

ජාතික පොලිස් කොමිෂන් සභාව

**වගඋත්තරකරු**

**දිනය : 2026.01.27**

| | | |
|---|---|---|
| **ඉදිරියේ දී** | **විනිසුරු කේ.ටී.චිත්‍රසිරි** | **(සභාපති)** |
| | **ජේ.ජේ.රත්නසිරි** | **(සාමාජික)** |
| | **එස්.නන්දසේකරන්** | **(සාමාජික)** |

පෙනී සිටීම :- අභියාචක සිටී.
වගඋත්තරකාර ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂ ආර්.එම්.එස්.පී.රත්නායක මහතා.

**-<u>නියෝගය</u>-**

දෙපාර්ශවය විසින් ඉදිරිපත් කරන ලද කරුණු වලට සවන් දුනිමු. අභියාචක විසින් මෙම විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරන ලද 2020.11.15 දිනැති අභියාචනා පෙත්සම මඟින් ඉල්ලා ඇත්තේ, 2016.11.23 දින සිට 2018.06.01 දින දක්වා වන කාලපරිච්ඡේදය තුළ ඔහු සේවයේ නියුතුව නොසිටියත්, ඒ සඳහා හිඟ වැටුප් ලබා දෙන ලෙසයි. ඊට අමතරව ඔහු ඉල්ලා ඇත්තේ, මේ සම්බන්ධයෙන් ඔහු වෙත සාධාරණයක් ඉටුකර දෙන ලෙසයි. අභියාචක කරුණු ඉදිරිපත් කරමින් දන්වා සිටින්නේ, 2023.11.16 දින සිට ඔහු සේවයට වාර්තා නොකරන ලද්දේ, සේවයට වාර්තා කිරීමට ස්ථානාධිපතිවරයා ඉඩ නොදුන් නිසා බවයි. ඒ අනුව ඔහුව පොලිස් කොමිෂන් සභාව විසින් නැවත

සේවයේ පිහිටුවන ලද බවටද ඔහු කරුණු දක්වා සිටී. ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කර ඇති 2021.11.26 දිනැති ඔවුන්ගේ වාර්තාවට අපගේ අවධානය යොමු කරමින්, එහි 03 වන ඡේදයට විශේෂ අවධානය යොමු කරන ලදී. එහි සඳහන් වන්නේ, අභියාචක 2016.11.23 දින කොස්ලන්ද පොලිස් ස්ථානයේ දෛනික තොරතුරු සටහන් පොතේ දීර්ඝ සටහනක් යොදා අනවසරයෙන් පොලිස් ස්ථානයෙන් පිටව ගොස් තිබූ බවයි. ඉන් අනතුරුව විදුලි පණිවිඩයක් මඟින් අභියාචක වෙත දන්වා ඇත්තේ, කිසියම් ගැටළුවක් මත රාජකාරියට නොපැමිණෙන බවයි.

ඒ හේතුවෙන් ඔහුට වහාම රාජකාරියට වාර්තා කරන ලෙසටත්, ප්‍රශ්නයක් ඇත්නම් ඒ සඳහා විමර්ෂණයක් කිරීමට පැමිණ ප්‍රකාශයක් ලබා දෙන ලෙසටත් ලියාපදිංචි ලිපියක් මඟින් දැනුවත් කර තිබූ බවත්, එහි සඳහන් කර ඇත. ඊට අමතරව එම පණිවුඩය අභියාචකගේ පියාට ලබා දුන් බවද එහි තවදුරටත් සඳහන් වේ. ඒ අනුව පොලිස් කොමිෂන් සභාව පවසා සිටින්නේ, දැනුම් දීමකින් තොරව අභියාචක සේවයට වාර්තා නොකළ බවයි.

කෙසේ වෙතත් අභියාචක විසින් ඉල්ලා ඇත්තේ, ඔහු සේවයේ නොසිටි කාලය සඳහා හිඟවැටුප් ලබා දෙන ලෙසයි. අභියාචක සේවයට වාර්තා නොකිරීම සම්බන්ධයෙන් දෙපාර්ශවය විසින් වෙන වෙනම කරුණු ඉදිරිපත් කර ඇත. එබැවින් අභියාචක ස්ථානාධිපතිගේ බලපෑම නිසා සේවයට වාර්තා නොකළාද, එසේ නොමැති නම් ඔහුගේ කැමැත්තෙන් සේවයට වාර්තා නොකළාද යන්න මේ අවස්ථාවේදී තීරණය කළ නොහැක. කෙසේ වෙතත් අභියාචක ඉහත කී කාලපරිච්ඡේදය තුළ සේවයේ නිරතව සිට නැත. යම් රජයේ සේවකයකු නියමිත සේවයේ නිරතව නොසිටියේ නම් ඔහුගෙන් රජයට සිදු කළ යුතු සේවය රජයට ලබා දී නැත. අභියාචක ඉල්ලා ඇති පරිදි නියෝගයක් නිකුත්

කළහොත් රජයට සේවයන් ලබා නොදී ඇති අවස්ථාවක් තිබියදීත් ඒ සඳහා රජයේ මුදල් ගෙවීමට සිදුවනවා ඇත. එවැනි තත්ත්වයක් යටතේ, රජයට සේවයක් කර නොමැත්තේ නම් එම කාලපරිච්ඡේදයට වැටුප් ලබා දෙන ලෙස නිර්දේශයක් නිකුත් කිරීමට හැකියාව ලැබෙන්නේ නැත. ඒ අනුව හිඟ වැටුප් ඉල්ලමින් අභියාචක විසින් කර ඇති ඉල්ලීම නිෂ්ප්‍රභා කරමු.

ඉහත කරුණු සළකා බලා අභියාචකගේ අභියාචනය නිෂ්ප්‍රභා කරමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි.

එස්.නන්දසේකරන්
(සාමාජික)

දෙව්මිනි/